**බලංගොඩ අධ්‍යාපන කලාපය**
**ර/ විද්‍යාකර මහා විද්‍යාලය ඕපනායක**
**පළමුවන වාර විභාගය**
**7 ශ්‍රේණිය සිංහල භාෂාව හා සාහිත්‍යය**

කාලය පැය 2යි.

**i කොටස**

ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.

පහත සඳහන් වාක්‍යවල ඉරි ඇඳි කොටසට ගැළපෙන පිළිතුර තෝරන්න.

1. සිරිමල් කුකුළත් අතින් අරන් අපේ නිවසට පැමිණියේය.
   1.හොර රහසේම 2.කුකුළකු අරගෙන 3.ඉක්මනින්ම 4.උදෑසනින්ම

2. ඒ ආරංචිය ඇසූ ඔහුගේ ඉහේ මලක් පිපුණි.
   1.හිසෙහි මලක් හට ගැනීම 2.උදහසට පත් විය 3.සතුටට පත් විය 4. සිනාසෙන්නට විය

3. නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත පදය තෝරන්න.
   1.විමර්ශන 2.ඝණ්ඨාර 3.පරිනාමය 4.ලදැරිය

4. මහාප්‍රාණ අක්ෂරයක් අඩංගු නොවන පිළිතුර තෝරන්න.
   1.අඛණ්ඩ 2.ග්‍රන්ථය 3.ශිෂ්ටාචාරය 4. අනුරාධ

5. දී ඇති පදයට සමාන අර්ථයක් නොදෙන පදයක් සහිත පද පේළිය තෝරන්න.
   1.මිතුරු- සකි, මිත්‍ර, සබඳ 2.හිරු- දිනමිණ, දිවයුරු, චන්ද්‍රයා
   3.අහස- අඹර, ගුවන, නුබ 4.මව- අම්මා, මාතා, ජනනී

6. කමත් භාෂාවේ එන වචනයක් නොවන්නේ
   1.අඬහැරය 2.මුත්තෙට්ටුව 3.ඉපනැල්ල 4.ඉල්ලම

7. පහත පද අතුරින් අනුක්ත පදයක් නොවන්නේ
   1.තොප 2.මිනිසුන් 3.කුරුල්ලෝ 4.ගායිකාවක

8. "අවුල්" යන්නට සුදුසු විරුද්ධ පදය තෝරන්න.
   1.පැටලිලි සහගත 2.නිරවුල් 3.වෙනස් 4.අයහපත්

9. මිශ්‍ර ක්‍රියාවක් නොවන්නේ,

1.නටමින් 2.මිනිසුන් 3.බලමින් 4.දුවමින්

10. නාම විශේෂණයක් සහිත පදයක් නොවන්නේ,

1.වේගයෙන් දුවයි 2.නිල් අහස 3.කුරුලු කූඩුව 4.කමිසය

11. අකුරු කරන්නට උපදෙස් සපයන ග්‍රන්ථයක් නොවන්නේ,

1.සකස්කඩ 2.බුද්ධ ගජ්ජය 3.හිතෝප දේශය 4.සුභාෂිතය

සුදුසු උක්ත පද යොදා හිස්තැන් පුරවන්න.

12. ...................... හොඳින් උගන්වති.

1.ගුරුවරුන් 2.ඔවුන් 3.මම 4.ගුරුවරු

13. .......................සරුංගලය හදයි.

1.ඔවුහු 2.මල්ලී 3.අපි 4.නුඹලා

14. ප්‍රථම පුරුෂ බහු වචන පදයක් වන්නේ,

1.නුඹලා 2.තොපි 3.අපි 4.කම්කරුවෝ

15. "ජනයා බහුල වශයෙන් වාසය කරන" යන්නට සුදුසු තනි පදය වන්නේ,

1.ජන ශූන්‍ය 2.ජනහිත 3.ජනාකීර්ණ 4. ජනබලය

16. පහත ක්‍රියා අතුරින් පූර්ව ක්‍රියාවක් නොවන්නේ,

1.බලා 2.ගොස් 3.බල බලා 4.ගායනා කර

17. සිංහල අක්ෂර මාලාවේ ඇති අල්පප්‍රාණ අක්ෂර ගණන වනුයේ,

1. 12 කි. 2. 10 කි. 3. 14 කි. 4. 13 කි.

18. අභිකුණ්ඨික ජනයා "සත්" ලෙස හඳුන්වනුයේ,

1.කුල්ල 2.කුළය 3.බේසම 4.හිරමනය

පහත ප්‍රස්තාව පිරුළු සම්පූර්ණ කරන්න.

19.අගේ ඉඳන් ............................................................

20.බීරි අලින්ට ............................................................

ලකුණු (1x20)

**පළමු ප්‍රශ්නය හා දෙවන ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 5කට පිළිතුරු සපයන්න.**

**01. පහත දී ඇති මාතෘකා අතුරින් එකක් තෝරාගෙන වචන 150 කට නොඅඩු රචනයක් ලියන්න.**

**01. වන අසිරිය රැක ගනිමු.**
**02. සාරධර්ම සපිරි සමාජයක්**
**03. මත් උවදුර දුරු කරමු.**
**04. සාමය හා සමගියෙන් සපිරි රටක්.**

**02. ඔබ පාසලේ ඇති උත්කර්ෂවත් අන්දමින් පැවැත්වෙන ක්‍රීඩා උත්සවය නැරඹීමට ආරාධනා කරමින් දුර සිටින ඔබේ මාමාට ලියන ලිපිය සකස් කරන්න.**

**(ලකුණු 15)**

**03. පෙළ පොත ඇසුරින් පිළිතුරු සපයන්න.**

**(i) වැලිවිට සරණංකර සංඝරාජ හිමි විසින් ලියන ලද ධර්ම ග්‍රන්ථ 2ක් නම් කරන්න.**
**(ii) අභිකුණ්ඩික ජනයා පිළිබඳ සඳහන් වන ජාතක කතාව කුමක්ද?**
**(iii) එඩ්මන්ඩ් පීරිස් රදගුරු හිමි විසින් රචිත ග්‍රන්ථ 2ක් නම් කරන්න.**
**(iv) පහත කවිය සම්පූර්ණ කරන්න.**

ගලක් පළා ගලක් දුටිමි
එගල පළා රිදී දුටිමි
..................................
..................................

**(v) ඔබ ඉගෙනගත් ඉඟි වැකි 2ක් ලියන්න.**

**(ලකුණු 2x5 = 10)**

**04. පහත සඳහන් ප්‍රකාශ උපුටාගත් පාඩම සහ ප්‍රකාශය කළේ කා විසින් කා හටද? යන්න ලියන්න.**

**(i) "බැහැ, බැහැ, ඔබ මා එතැනට කැඳවා ගොස් පැන දුවාවි"**
**(ii) ඇත්ත, ඒ වුණාට ධාන්‍ය නැතිව පාන් හදන්නේ කොහොමද?**
**(iii) "මොකටද අයියේ කුඹුරට යතුරක්"**
**(iv) ඒක ලීවලින් හදපු එකක් නේද?**
**(v) "මම මේක තියා ගන්නද?**

**(ලකුණු 2x5 = 10)**

**05.** ඔබේ පන්තිය අලංකාරය හා කළමනාකරණය කර ගැනීම සඳහා ගුරුතුමිය හා පන්ති නායකයා අතර සිදුවන සංවාදයක් ගොඩ නගන්න. (පංති නායකයා ඔබ යැයි සිතන්න)

(ලකුණු 10)

**06.** පහත සඳහන් ඉඟි වැකිවලින් හැඟවෙන අදහස ලියන්න.

(අ) (i) කළුනික සොයනවා ......................................

(ii) කිඹුල් කඳුළු හෙළනවා ......................................

(iii) කරල පැහිලා ......................................

(iv) භාංකවිසියක් ......................................

(v) කොළේ වහලා ......................................

(ලකුණු 1x5 =5)

පහත සඳහන් ප්‍රස්තාව පිරුළු සම්පූර්ණ කරන්න.

(ආ) (i) ආඬිහත්දෙනාගේ ..............................වාගේ

(ii) ඉබ්බා දියේ දැම්මා ම ..............................කීවාලු

(iii) ඌරන් කැකුණ තලන කොට ..............................ජය මඟුල්ලු.

(iv) උණු හින්ද බොන්නත් බෑ ..............................හින්ද අහක දාන්නත් බෑ.

(v) අත්තෙන් අත්තට පනින කුරුල්ලා ..............................නසී.

(ලකුණු 1x5 =5)